Article 12 (1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2019/07/19

පැමිණිලිකාරිය : ආර්.ටී.එච්. හක්මන මිය,
නො. 1/115, පරණ කැස්බෑව පාර,
ගංගොඩවිල, නුගේගොඩ.

වගඋත්තරකරුවන් : විදුහල්පති,
අනුලා විද්‍යාලය,
නුගේගොඩ.

<u>පැමිණිලි අංකය : HRC/5057/16</u>

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, තම දියණිය වන තිරුණි ඉවන්යා කුමාරිහාමි නවරත්න දැරිය 2017 වසරේ නුගේගොඩ අනුලා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමට ආදි ශිෂ්‍ය පදනම යටතේ අයදුම් කළ බවත්, එසේ අයදුම් කිරීමෙන් පසු පාසලේ අධ්‍යාපනය ලැබූ කාලය සඳහා ලකුණු 26 ක් ද, අධ්‍යාපන ජයග්‍රහණ සඳහා ලකුණු 09 ක්ද, විෂය සමගාමී ජයග්‍රහණ සඳහා ලකුණු 01 ක්ද, පාසැලට ලබාදුන් සහයෝගය සඳහා ලකුණු 7 1/2 ක්ද ඇතුළුව මුළු ලකුණු 43 1/2 ක් ලැබුනු බවත්, පාසලේ මෙම පදනම යටතේ ඇතුළත් කර ගැනීමේ කඩඉම් ලකුණ වූයේ 32.75 ක් බවත්, ඒ අනුව පැමිණිලිකාරියගේ දරුවා අනුලා විද්‍යාලයට ඇතුළත් කර ගැනීමට ප්‍රමාණවත් ලකුණු සහ සුදුසුකම් සපුරා තිබියදී විද්‍යාලයට ඇතුළත් කර ගෙන නොමැති බවත්ය.

මේ පිළිබඳව පසුව විමසා සිටීමේදී තම ස්වාමි පුරුෂයා ක්‍රිස්තියානි භක්තිකයෙකු බැවින් විද්‍යාලයට ඇතුළත් කර ගැනීමට නොහැකි බවට විද්‍යාලයෙන් වාචිකව දැනුම්දුන් බව සඳහන් කර ඇත. ඒ අනුව පැමිණිලි පාර්ශවය ප්‍රකාශ කර ඇත්තේ, විද්‍යාලයට ඇතුළත් කර ගැනීමේදී සලකා බලන නිර්ණායක අනුව ලකුණු උපයාගෙන තිබියදීත් පියා ක්‍රිස්තියානි ආගමිකයෙකු වීමෙහි හේතුව පදනම් කරගෙන දරුවා පාසැලට ඇතුළත් කර නොගැනීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් බවයි.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / Email: sechrc@gmail.com

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

මේ සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලි පාර්ශවය ඉදිරිපත් කරන ආකාරයට මෙම දරුවා ආදි ශිෂ්‍ය පදනම යටතේ ඇතුළත් කිරීම සඳහා OG 38 යටතේ අයදුම්පත් යොමු කර තිබූ බවත්, සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් පසුව ලකුණු 43 1/2 ක් ලබාදී ඇති බවත්ය. මෙම පදනම යටතේ විද්‍යාලයට ඇතුළත් කර ගැනීමේ කඩඉම් ලකුණ වූයේලකුණු 32.75 ක් වන බවත්. ඒ අනුව පැමිණිලිකාරියගේ දරුවා විද්‍යාලයට ඇතුළත් කර ගැනීමට සුදුසුකම් සපුරා ඇති නමුත්, මෙම දරුවා පාසලට ඇතුළත් කිරීම සම්බන්ධයෙන් 2016.11.04 වන දින විරෝධතාවයක් ඉදිරිපත් කර ඇති බවත්, ඒ අනුව මෙම පැමිණිලිකාරියගේ ස්වාමි පුරුෂයා ක්‍රිස්තියානි ආගමේ බැවින් බෞද්ධ දරුවන් ඇතුළත් කරන පාසලකට එවැනි අයෙකු ඇතුළත් කර ගැනීම කළ නොහැකි බවට එම විරෝධතාවය මගින් කරුණු ඉදිරිපත් කර ඇති බවත් සඳහන් කර ඇත. ඒ අනුව එම විරෝධතාවය හේතුවෙන් මෙම දරුවා විද්‍යාලයට ඇතුළත් කර ගෙන නොමැති බවද සඳහන් කර ඇත. තවද, ආචාර්ය ජ්.ඩබ්ලිව්.අධිකාරම් මැතිතුමා සහ පි.බී.ප්‍රනාන්දු මැතිතුමා ඇතුළු අනෙකුත් පිරිස විසින් 1941 වසරේදී සිය පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් මෙම පාසල බෞද්ධ බාලිකාවන් සඳහා පිහිටුවන ලද්දේ එවකට රටේ බිහිවෙමින් පැවති මිෂනාරි අධ්‍යාපන ක්‍රමය තුළින් බෞද්ධ බාලිකාවන් සඳහා නිසි අධ්‍යාපනයක් නොලැබෙන බව හඳුනාගැනීමෙන් පසුව වන අතර, එම පූර්වාදර්ශය අනුව යමින් වර්තමානයේදී ද බෞද්ධ බාලිකාවන් හට අධ්‍යාපනය ලබාදීම සම්ප්‍රදායක් ලෙස විද්‍යාලීය කළමනාකරණ කණ්ඩායම විසින් පවත්වාගෙන යනු ලබන බවද දන්වා ඇත.

මෙම පැමිණිලිකාරිය බෞද්ධ ආගමිකයෙකු හා විද්‍යාලයේ ආදි ශිෂ්‍යාවක වන බැවින් මෙම දරුවා විද්‍යාලයට ඇතුළත් කර ගැනීමට සමතයට පත්වීමට හැකියාවක් තිබේද යන ප්‍රශ්නයට පිළිතුරු සපයමින් වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කර ඇත්තේ, "පාසැල් වල පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේ 2016.05.16 දිනැති අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්ගේ චක්‍රලේඛනයෙහි 3 : 2 ඡේදයට අනුව මෙම විද්‍යාලයේ ආගමික අනුපාතයක් නොමැති අතර, සම්ප්‍රදායානුකූලව මෙම විද්‍යාලයට සිසුන් බඳවා ගනු ලබන්නේ බෞද්ධ පදනම යටතේ බැවින් ආගමික අනුපාතයක් නොමැති බවයි. මෙම සිද්ධිය සමතයකට පත්කර ගත නොහැක්කේ මේ හා සමාන නඩු නිමිති කිහිපයක් යෙදී ඇති බැවින් ඒවාට ද යම් බලපෑමක් ඇති විය හැකි බැවින්" වන බවද දන්වා ඇත.

දැනට විද්‍යාලයේ වෙනත් ආගම් වල දරුවන් අධ්‍යාපනය ලබන බව පැමිණිලි පාර්ශවය ප්‍රකාශ කර ඇති අතර. ඒ සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කර ඇත්තේ බොහෝ විට දරුවන් පාසල් වලට ඇතුළත් කර ගනු ලබන්නේ ඉල්ලුම්කරුගේ ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු පදනම් වීම මත බැවින් මේ සිද්ධියේදී ද බෞද්ධ ආගමික මව ලබාදුන් තොරතුරු අනුව වන අතර, බොහෝ විට පියා අන්‍යාගමික බව දැනගත හැක්කේ දරුවා පාසලට ඇතුළත් වූ පසුව පමණක් බවත් ඒ අනුව බෞද්ධ නොවන දරුවන් පාසල තුළ සිටිය හැකි බවත්ය.

**පැමිණිලි පාර්ශවයේ වැඩිදුර කරුණු දැක්වීම :-**

පැමිණිල්ලේ නීතිඥ මහතා විසින් කරුණු ඉදිරිපත් කරමින්, 1987, 1989 සහ 1992 යන වසර වල බෞද්ධ නොවන දරුවන් මෙම පාසැලට ඇතුලත් කර ගෙන ඇති බවට සඳහන් කර ඇති අතර ඒ අනුව, 2000 වර්ෂයේ අ.පො.ස. උසස් පෙළට පෙනීසිටි තිලිණි පෙරේරා, අපර්ණා ෆොන්සේකා, ඉනෝකා සයුරි මිස්කින් යන අය බෞද්ධ දරුවන් නොවන බවට දක්වා ඇත.

එසේම පහත නම් සඳහන් දරුවන්ගේ පියා බෞද්ධ නොවන අය වන බවට සඳහන් කර ඇත.

2002 වර්ෂයේ අ.පො.ස. උසස් පෙළට පෙනීසිටි සුටාමි හසන් දැරියගේ පියා ඉස්ලාම් ආගම අදහන අයෙක් වන අතර, 2005 වසරේ අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනීසිටි හර්ෂා ජයකොඩි සහ කනේෂි ජයසිංහ යන දරුවන්ගේ පියා ද බෞද්ධ ආගමිකයෙකු නොවන බවත්, 2005 අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනීසිටි ෆර්ෂා ජුමාත් යන දැරියගේ පියාද බෞද්ධ ආගමිකයෙකු නොවන බවත්, තවද, 2009 අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනීසිටි ප්‍රියාති සැන්ඩර්ස් යන ශිෂ්‍යාව ක්‍රිස්තියානි දහම අදහන ශිෂ්‍යාවක් වන අතර, ඇය අ.පො.ස. සාමාන්‍ය පෙළ ආගම විෂය සඳහා පෙනීසිට ඇත්තේ කතෝලික දහම විෂය වන බවත් දක්වා ඇත.

මේ අනුව වගඋත්තරකරුවන් ප්‍රකාශ කරන ආකාරයට මෙම පාසැලේ 100% ක් බෞද්ධ ආගමික අනුපාතය අනුව පමණක් දරුවන් බඳවා ගන්නා බවට වන ප්‍රකාශය සාවද්‍ය බව පැමිණිල්ලේ කරුණු දැක්වීමේදී සඳහන් කර ඇත.

**වගඋත්තරකරුවන්ගේ වැඩිදුර කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිලි පාර්ශවය ඉදිරිපත් කරන කාරණා සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කර ඇත්තේ, අධ්‍යාපන අමාත්‍යංශයේ නියමයන්ට අනුව පාසැලකට දරුවන් ඇතුලත් කිරීමේ ප්‍රධාන අවස්ථා තුනක් ඇති බවත් එනම්, 12 වන ශ්‍රේණිය, 6 වන ශ්‍රේණිය හා පළමු ශ්‍රේණිය වන බවත් දක්වා ඇත.

අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් දරුවන් 12 වන ශ්‍රේණියට ද, පස්වන ශ්‍රේණියට ශිෂ්‍යත්ව විභාගය සමත් දරුවන් 6 වන ශ්‍රේණියට ද බඳවා ගන්නා අතර, පළමු ශ්‍රේණියට බඳවා ගනු ලබන්නේ අධ්‍යාපන අමාත්‍යංශය නිකුත් කරනු ලබන චක්‍රලේඛ අනුව මූලික ගණ 07 ක් අනුවය. ඒ අනුව 6 වන ශ්‍රේණිය සහ 12 වන ශ්‍රේණියට බෞද්ධ නොවන අන්‍යාගමික දරුවන් ඇතුලත් වී සිටිය හැකි අතර, පළමු ශ්‍රේණියට බඳවා ගැනීමේදී පමණක් මතු දක්වන ලද චක්‍රලේඛනයේ 3 : 2 අනුව මෙම විද්‍යාලය රජයට පවරා ගැනීමේදී කිසිදු ආගමික අනුපාතයක් සටහන් කොට නොමැති බවත්, ඒ

අනුව ආගමික අනුපාතය අනුව දරුවන් පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා කිසිදු මාර්ගෝපදේශයක් නොමැති බවත් සඳහන් කර ඇත.

පැමිණිල්ල වෙනුවෙන් නීතිඥ මහතා ප්‍රකාශ කර ඇත්තේ, 100% ක බෞද්ධ ආගමික පදනමක් නුගේගොඩ අනුලා විද්‍යාලයේ පවතින බව ප්‍රකාශ කළ ද එවැනි තත්ත්වයක් ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවූ බවත්, ඒ අනුව මෙම දරුවා විද්‍යාලයට ඇතුළත් කර නොගැනීම දරුවාට සිදුකරන වෙනස්කමක් බවත්, ඒ අනුව දරුවා ඇතුළත් කර ගැනීමට කටයුතු කරදෙන ලෙසට ඉල්ලා සිටින බවත්ය.

**නිරීක්ෂණ :-**

මෙම පැමිණිලිකාරියද නුගේගොඩ අනුලා විද්‍යාලයේ ආදි ශිෂ්‍යාවක් වන අතර, ඇයගේ දරුවා විද්‍යාලයට ඇතුළත් කර ගැනීමට ආදි ශිෂ්‍ය ගණය යටතේ අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව චක්‍රලේඛ ප්‍රකාරව අදාළ නිර්ණායකයන් අනුව ලකුණු 43 1/2 ක් උපයාගෙන ඇති බවත්, එය විද්‍යාලයට ඇතුළත් කර ගැනීමේදී මෙම ගණය යටතේ කඩඉම් ලකුණු සීමාව වන ලකුණු 32 1/2 ඉක්මවා ඇති අතර, ඒ අනුව විද්‍යාලයට ඇතුළත් කර ගැනීමට සුදුසුකම් සපුරා ඇති බවත් නිරීක්ෂණය වේ.

මෙම පැමිණිලිකාරියගේ දියණිය විද්‍යාලයට ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් විරෝධතා ඉදිරිපත් වී ඇති අතර, එම විරෝධතා වලින් දක්වා ඇත්තේ මෙම විද්‍යාලයට ඇතුළත් කිරීමට නියමිත දරුවාගේ පියා ක්‍රිස්තියානි ආගමිකයෙකු බවත්, ඒ අනුව ආගමික අනුපාතය අනුව මෙම විද්‍යාලයට 100% බෞද්ධ පාසලක් බැවින් මෙම දරුවා විද්‍යාලයට ඇතුළත් කර නොගන්නා ලෙසත්ය.

වගඋත්තරකරුවන් විසින් ද මෙම විරෝධතා පරීක්ෂණයේදී මෙම දරුවාගේ පියා ක්‍රිස්තියානි ආගමික අයෙකු බව හඳුනාගෙන ඇති අතර, පියාගේ ආගම දරුවාගේ ආගමද වන්නේය යන උපකල්පනය මත මෙම දරුවා විද්‍යාලයට ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප කර ඇති බවද නිරික්ෂණය වේ.

නමුත් මෙම පැමිණිලිකාර කාන්තාව බෞද්ධ කාන්තාවක් වන අතර, අනුලා විද්‍යාලයේ ආදි ශිෂ්‍යාවක් ද වේ.

එමෙන්ම මෙම පැමිණිලිකාරියගේ ස්වාමි පුරුෂයා වන ඉවන්ත නවමල් නවරත්න යන අය දිවුරුම් ප්‍රකාශයක් මගින් ප්‍රකාශ කර ඇත්තේ තමා ක්‍රිස්තියානි ආගම අදහන අයෙකු වුව ද තම දියණිය බෞද්ධ ආගම අදහන අයෙකු බවත්, ඇයට බෞද්ධ අධ්‍යාපනය ලබාදීමට තමාගේ විරෝධතාවයක් නොමැති බවත්ය.

පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද කරුණු අනුව අනුලා විද්‍යාලය 100% ක් බෞද්ධ දරුවන් අධ්‍යාපන ලබන පාසැලක් බව සඳහන් කළ ද එය අසත්‍ය බවත්, දැනට විද්‍යාලයේ අධ්‍යාපනය ලබන සහ මීට පෙර වසර වල අධ්‍යාපනය ලබා ඇති අන්‍යාගමික දරුවන්ගේ නම් ලයිස්තුවක් ද ඉදිරිපත් කර ඇති අතර, එම තොරතුරු ප්‍රතික්ෂේප කිරීමට වගඋත්තරකරුවන් අපොහොසත්වී ඇත.

එමෙන්ම, 6 වන ශ්‍රේණිය සහ 12 වන ශ්‍රේණියට අන්‍යාගමික දරුවන් ඇතුලත්වීමට හැකියාවක් ඇති බවත්, චක්‍රලේඛන ප්‍රකාරව පළමු ශ්‍රේණියට බෞද්ධ නොවන දරුවන් ඇතුලත් කිරීමට ප්‍රතිපාදන නොමැති බවත් වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත. නමුත් මෙහිදී පැමිණිලිකාරිය බෞද්ධ අයෙකුවීම තුළ එම දරුවා ද බෞද්ධ ආගම අදහන අවස්ථාවක පැමිණිලිකරුගේ ස්වාමි පුරුෂයා බෞද්ධ නොවීම පමණක් පදනම් කරගෙන කටයුතු කිරීම පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බව නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

ඉහත නිරීක්ෂණ සලකා බැලීමේදී පැමිණිලිකාරියගේ දරුවා ආදි ශිෂ්‍ය පදනම යටතේ නුගේගොඩ අනුලා විද්‍යාලයට ඇතුලත් කිරීමට ප්‍රමාණවත් ලකුණු ලබා ඇති බැවින්ද, 100% බෞද්ධ පදනමක් මත අනුලා විද්‍යාලයට දරුවන් ඇතුලත් කර ගන්නා බව ප්‍රකාශ කළ ද වෙනත් ආගමික දරුවන් එම විද්‍යාලයට මීට පෙර කුමන හෝ ශ්‍රේණියකට ඇතුලත් කර ඇති බව පරීක්ෂණයේදී තහවුරු වී ඇති හෙයින්ද, පැමිණිලිකාරිය හා ඇයගේ දියණිය බෞද්ධ ආගම අදහන බැවින්ද, දැරියගේ පියා ක්‍රිස්තියානි ආගම අදහන අයෙකු බව පමණක් සැලකිල්ලට ගෙන දරුවා විද්‍යාලයට ඇතුලත් කර ගැනීම ප්‍රතික්ෂේප කිරීම තුළින් වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 (2) ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

පැමිණිලිකාරියගේ දරුවා වන තිරුණි ඉවන්යා කුමාරිහාමි නවරත්න යන අය නුගේගොඩ අනුලා විද්‍යාලයේ 2017 වර්ෂයේ පළමු ශ්‍රේණියට එනම්, 2019 වර්ෂයේ තෙවන ශ්‍රේණියට ඇතුලත් කිරීමට කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019.09.02. වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :-

1. අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මහතා,
   අධ්‍යාපන අමාත්‍යංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්,
   අධ්‍යාපන අමාත්‍යංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල.

B/R